ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1982 අංක 52 දරන

# කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 දෙසැම්බර් මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1982 දෙසැම්බර් මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : ශත 45 තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1982 අංක 52 දරන කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 දෙසැම්බර් 31 වන දින]

එල්. ඩී.—ඕ. 14/80

1968 අංක 15 දරන කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 1982 අංක 52 දරන කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1968 අංක 15 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.*

2. (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) 1968 අංක 15 දරන කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල පනතේ දීර්ඝ නාමය එහි එන "අමාත්‍යවරයාගේ නියමයක් මගින් ප්‍රකාශ කරනු ලැබිය හැකි ප්‍රදේශ ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් සඳහා සුදුසු විය හැකි පරිදි සහ එයට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු" යන වචන වෙනුවට "අමාත්‍යවරයාගේ නියමයක් මගින් එකී සංස්ථාව විසින් ඉදිකිරීම් කටයුතු සහ ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපදේශක සේවාවන් භාරගැනීම සඳහා සහ ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*"කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල පනත", "කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය" සහ "මණ්ඩලය" පිළිවෙලින් "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත", "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව" සහ "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බව.*

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් කවර වූ හෝ ලිඛිත නීතියක සඳහන් වන—

(අ) "කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල පනත" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත" යන වචන; සහ

(ආ) "කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය" සහ කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය හඟවන "මණ්ඩලය" යන වචන වෙනුවට පිළිවෙලින් "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව" සහ "සංස්ථාව" යන වචන

ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් දන්වීමක, නිවේදනයක, සාධන පත්‍රයක හෝ වෙනත් ලියවිල්ලක වූ "කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල පනත" සහ "කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය" පිළිබඳව වූ සෑම සඳහනක් ම, පිළිවෙලින් "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත" සහ "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව" පිළිබඳව වූ සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය පහත දැක්වෙන ආකා යට මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙ වට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(1) යම් බිම් ප්‍රදේශයක් පහත් බිම්, වගුරු, උඩු ලෙ ගොහොරු ප්‍රදේශයක් බවට අමාත්‍යවරයා සෑහීමට පත වන අවස්ථාවක සහ ඒ බිම් ප්‍රදේශය යම් පළාත් පාල ආයතනයක බල සීමාව තුළ පිහිටා තිබෙන අවස් වක පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා සහ එ බිම් ප්‍රදේශය පිහිටා ඇත්තේ කවර පළාත් පාලන ආය නයක් හෝ ආයතන තුළ ද එකී ආයතනය හෝ ආයත ද විමසීමෙන් පසු නැතහොත් එකී බිම් ප්‍රදේශය පිහිටිය වූ ප්‍රදේශය සඳහා පළාත් පාලන ආයතනයක් සංස් ථාපනය කර නොමැති නමුත් යම් නීතියක් මගින් හෙ නීතියක් යටතේ වෙනත් යම් ආයතනයක් ඇති කොට පිහිටුවා ඇති අවස්ථාවක දී ඒ ආයතනය භාර අමාත්‍ය වරයාගේ එකඟත්වය ඇතිව ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් ඔහු විසින් ඒ ප්‍රදේශය මේ පනතේ කාර්ය සඳහා ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ ප්‍රදේශයක් බව ප්‍රකාශයට පත් කළ යුතු ය."; තව ද

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් "ඒ ප්‍රදේ ශය ගොඩ කොට සංවර්ධනය කිරීම සහ එය ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් සඳහා සුදුසු බවට පත් කිරීම" යන වචන වෙනුවට "ඒ ප්‍රදේශය ගොඩ කර සංවර්ධනය කිරීම" යන වචන ආදේශ කිරීමෙන්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ සඳහන් "2 වන වගන්තිය යටතේ වූ නියමයක් මගින් ප්‍රකාශිත ඉඩම හෝ ඉඩම් පිහිටියේ යම් ප්‍රාදේශීය බල මණ්ඩලයක බලසීමාව තුළ ද, ඒ ප්‍රාදේශීය බල මණ්ඩලය වෙත පැවරී ඇත්තා වූ ද යම් ඉඩමක් හෝ ඉඩම්" යන වචන වෙනුවට "2 වන වගන්තිය යටතේ වූ නියමයක් මගින් ප්‍රකාශිත ඉඩම හෝ ඉඩම් පිහිටියේ යම් පළාත් පාලන ආයතනයක් හෝ ආයතන නැතහොත් වෙනත් යම් ආයතනයක බලසීමාව තුළ ද, ඒ පළාත් පාලන ආයතනය, ආයතන නැතහොත් වෙනත් යම් ආයතනය සතු කොට දී ඇත්තා වූ ද ඉඩමක් හෝ ඉඩම්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ සඳහන් "ඉඩම පිහිටියේ යම් ප්‍රාදේශීය බලමණ්ඩලයක බල සීමාව තුළ ද ඒ ප්‍රාදේශීය බලමණ්ඩලය වෙත පැවරී නොමැති" යන වචන වෙනුවට "ඉඩම පිහිටියේ යම් පළාත් පාලන ආයතනය හෝ ආයතන නැතහොත් වෙනත් යම් ආයතනයක බල සීමාව තුළ ද, ඒ පළාත් පාලන ආයතනය හෝ ආයතන නැතහොත් වෙනත් යම් ආයතනය වෙත සතුකරදී නොමැති" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, යටත් පිරිසෙයින් සුදුසුකම් ලත් එක් සිවිල් ඉංජිනේරුවකුවත් ඇතුළත් විය යුතු වෙනත් සාමාජිකයන් හය දෙනෙක්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 27 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන ආකාරයට මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ සඳහන් "වාණිජමය හෝ කෘෂිකාර්මික කාර්යය; සහ" යන වචන වෙනුවට "වාණිජමය හෝ කෘෂිකාර්මික කාර්ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් "මණ්ඩලය සතු කර දී ඇති" යන වචන වෙනුවට "මණ්ඩලය වෙත සතු කර දී ඇති; සහ"; යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඇ) මේ පනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයක් මගින් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශ හැරුණු කොට අන් ප්‍රදේශවල ඉංජිනේරු ක්ෂේත්‍රයේ ඉදිකිරීම් කටයුතු සහ උපදේශක සේවාවන් භාර ගැනීමට.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන ආකාරයට මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් ඒ වගන්තිය නැවත අංක කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උපවගන්තියෙහි—

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ආඅ) ඒ ප්‍රදේශවල අධෝ ව්‍යුහ සංවර්ධනය හා සම්බන්ධ වූ වැඩ පිළිබඳ යම් යෝජනා ක්‍රමයක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ආආ) ඒ ප්‍රදේශවල වරායයන් සහ යාත්‍රා නැංගුරම් ලන ස්ථාන ඉදි කිරීම සහ වාරිමාර්ග, මුහුද ගොඩ කිරීම හා වෙරළබඩ සංවර්ධනය යන ක්ෂේත්‍රවල වැඩ භාරගැනීම;

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ඈඅ) ගොඩ නැගීම්, ඉංජිනේරු සහ ඉදිකිරීම් කට යුතුවලට අවශ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම ද ඇතුළුව ගොඩ නැගීම්, ඉංජිනේරු සහ ඉදි කිරීම් කටයුතු කිරීම ;

(ඈආ) ඉංජිනේරු සහ තාක්ෂණික කටයුතු සම්බන්ධයෙන් අනුශාසක සහ උපදේශක සේවා සැපයීම ;

(ඈඇ) ආණ්ඩුව විසින් අනුමත කරනු ලබන යම් ඉඩම් සංවර්ධන ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා යම් තැනැත්තකු සමග යම් ගිවිසුමකට එළඹීම ;" ; තවද

(3) ඒ වගන්තියේ තැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, (ආඅ), (ආආ) සහ (ඈඅ) ඡේද යටතේ වූ බලතල, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද යම් ප්‍රදේශයක ක්‍රියාත්මක කිරීම, නාගරික සංවර්ධන අධිකාරියේ පූර්ව අනුමතය නොමැතිව සංස්ථාව විසින් නොකරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

10. 9 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"අමාත්‍ය මණ්ඩලය විසින් සංස්ථාවට බාර කරන ලද යම් කටයුත්තක් එය විසින් කළ යුතු බව.

9අ. මේ පනතේ 9 වන වගන්තියේ කුමක් සඳහන් වුව ද මේ පනතේ 8 වන වගන්තියේ දක්වා ඇති අරමුණු මුදුන්පත් කර ගැනීමට අදාළ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි වූ යම් කටයුත්තක නිරතවීමට හෝ කටයුත්තක් කිරීමට හෝ සංස්ථාවට හැකි ය.".

මේ පනතේ 10 වන වගන්තිය අතීතයට බලපෑම.

11. මේ පනතේ 10 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ කරන ලද සංශෝධනය ඒ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමේ දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව මේ පනත ක්‍රියාත්මක වීමට පෙර ප්‍රධාන ප්‍රඥප්තියේ අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා සංස්ථාව යම් කටයුත්තක නිරතවූයේ ද නැතහොත් යම් කටයුත්තක් කරනු ලැබුවේ ද ඒ කටයුත්තෙහි නීත්‍යනුකූලව නිරත වූ ලෙස ද ඒ කටයුත්ත නීත්‍යනුකූලව කරන ලද ලෙස ද සලකනු ලැබිය යුතු ය.

12. 26 වන වගන්තියට ඉක්බිතිව මේ පනත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ වන සහ 26ආ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ සහ 26ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

26අ. සංස්ථාවේ සියලුම නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව සංස්ථාව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

26ආ. අල්ලස් පනතේ අර්ථානුකූලව සංස්ථාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.".

පළමුවන උපලේඛනය ඉවත් කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලැබේ.

අන්තර්කාලීන විධිවිධාන.

14. (1) මේ පනත ආරම්භ වීමේ දිනට පෙරාතුව ම පවතින හෝ බලාත්මක වන කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලයේ සියලු ගිවිසුම්, සම්මුති සහ අනෙකුත් සාධන පත්‍ර ඒවාට කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය වෙනුවට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව පාර්ශ්වකරුවකු වූවා නම් වන ආකාරයෙන් ම, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙනුවෙන් හෝ ඊට එරෙහිව පූර්ණ වශයෙන් සහ නියත වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය.

(2) මේ පනත ආරම්භවීමේ දිනට පෙරාතුව ම විනිශ්චයට නියමිතව තිබූ කොළඹ දිස්ත්‍රික්කය (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව පවරා තිබුණු සියලු සිවිල් නඩු, නඩු කටයුතු, අභියාචනා සහ අනෙකුත් නීති කටයුතු නතරවීමක් හෝ අත්හැර දැමීමක් හෝ නොවිය යුතු අතර ඒවා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් හෝ එයට එරෙහිව පවත්වාගෙන යාම හෝ ක්‍රියාත්මක කිරීම හෝ කළ හැකි ය.

(3) මේ පනත ආරම්භ වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පවත්නා (1) වන උපවගන්තියෙහි සඳහන් අයිතිවාසිකම්, බැරකම් සහ බැඳීම් නොවන්නා වූ, කොළඹ දිස්ත්‍රික්කයේ (පහත් බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලයේ සියලු අයිතිවාසිකම්, බැරකම් සහ බැඳීම්, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අයිතිවාසිකම්, බැරකම් හා බැඳීම් ලෙස සලකනු ලැබිය යුතු ය.